අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

පිරිවෙන් අධ්‍යාපන අංශය
பிரிவெனாக்கள் கல்வி பிரிவு
Division of Piriven Education

4 වන මහල, ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව / 4 வது மாடி, இசுருபாய, பத்தரமுல்ல, இலங்கை / 4th Floor, Isurupaya, Battaramulla, Sri Lanka
☎ +9411 278 5141 / +9411 278 4910 / +9411 278 4893 / +9411 278 4461 Fax +9411 278 5617 / +9411 278 4992 info@piriven.gov.lk www.piriven.gov.lk


මගේ අංකය / எனது இல. / My Number } ED/ST/BUD/8/4/2/MIND/2 ඔබේ අංකය / உமது இல. / Your Number }

දිනය / திகதி / Date } 2023.11.

සියලුම නායකාධිකාරී / පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ සහ බෞද්ධ සිලමාතා අධ්‍යාපන ආයතනාධිපතින් වහන්සේලා මගින්, ත්‍රිපිටක ධර්මය, භාවනා, බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, හා බෞද්ධ සංස්කෘතිය පරිවේණාචාර්ය වෙත,

**<u>සති භාවනා හා ආකල්ප සංවර්ධන නායකත්ව පුහුණු පස් දින නේවාසික වැඩසටහන</u>**

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශය හා සති පාසල පදනම එක්ව සංවිධානය කර ඇති පුහුණු වැඩ සටහනට ඔබ පිරිවෙනේ ත්‍රිපිටක ධර්ම ආචාර්යවරයා තෝරා ගෙන ඇති බව සතුටින් දන්වා සිටිමි.

02. මෙම පුහුණුවෙන් අපේක්ෂා වනුයේ සතිමත් ගුණාත්මක ආදර්ශ සම්පන්න ගුරුවරයෙකු පිරිවෙන් ප්‍රජාවට දායාද කිරීම යි. ඉදිරියේ දී පවත්වනු ලබන පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ ව දැනුවත් කිරීම හා පුහුණු කිරීමත්. එම පුහුණුලාභියා මගින් පිරිවෙන් සිසුන් වඩාත් ගුණාත්මක ව පුහුණු කිරීම ද මෙමගින් අපේක්ෂිතය.

03. මෙම පුහුණුව සාර්ථක ව හදාරන ගුරුවරුන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයේ නිරීක්ෂණ පිරිසක් බවට පත් කිරීම ද වැටුප් වර්ධක සඳහා ද ක්ෂේත්‍රයේ උසස්වීම්වලට ද අදාළ වේ. එබැවින් මෙම පුහුණු වැඩමුළුවට අනිවාර්යයෙන් ම අදාළ ගුරුවරයා සහභාගි කරවීමට කටයුතු කරන්න.

| | | |
|---|---|---|
| **දිනයන්** | - | **2023-12-04, 05,06,07,08 යන දිනයන්හි දී** |
| **ස්ථානය** | - | **මිතිරිගල නිස්සරණ වන සෙනසුන සති පාසල** |
| **නේවාසික වීම** | - | **2023-12-04 දින සවස 04.00 ට** |

04. වැඩසටහනට සම්බන්ධ වීමේ දී පැවිදි පරිවේණාචාර්යවරුන් හිස රැවුල් බා දිග නිය කපා ශ්‍රමණ සාරූප්‍යයට ගැළපෙන අයුරින් පත්කඩය, කොපි පොතක්, පෑනක් හා එදිනෙදා භාවිතයට අවශ්‍ය දෑ රැගෙන සහභාගි විය යුතු ය. ගිහි පරිවේණාචාර්යවරුන් සුදු ඇඳුමින් සැරසී සිටිය යුතු අතර අවශ්‍ය ප්‍රමාණයට අමතර සුදු කමිස, සරම, උතුරු සළුවක් රැගෙන පැමිණිය යුතු ය. ආයතනය තුළ ජංගම දුරකථන භාවිතය තහනම් කර ඇති බව ද අවධාරණය කරමි.

05. විමසීම - **සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (භාවනා හා සති පිරිවෙන්)**
**පූජ්‍ය මාරඹ චන්ද්‍රවිමල හිමි (071 440 26 20)**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (භාවනා)**
**පූජ්‍ය කටුගම්පල නන්දරතන හිමි (071 439 42 20)**

ගමන් මාර්ගය - කොළඹ - පුගොඩ - (බස් රථ ගමන් මාර්ග අංක 224) අවිස්සාවේල්ල - කිරිඳිවැල
අවිස්සාවේල්ල - කිරිඳිවැල - මිතිරිගල (ඇස්වත්ත හරහා - බස් රථ ගමන් මාර්ග අංක 290/688)

ආචාර්ය කුඹල්ගොඩ ධම්මාලෝක හිමි,
අධ්‍යක්ෂ (පිරිවෙන්),
අධ්‍යාපන ලේකම් වෙනුවට.

පිටපත්.
01. අධ්‍යක්ෂ (සංවර්ධන) - කරු. දැ.ගැ.ස
02. අධ්‍යක්ෂ (සැලසුම් හා පුහුණු) - කරු. දැ.ගැ.ස
03. නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ - පිරිවෙන් (විෂය) - පිරිස කැඳවා දීම සඳහා
04. නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ - පිරිවෙන් ( දකුණු පළාත්) - පිරිස කැඳවා දීම සඳහා
05. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - පිරිවෙන්( මාතර/අකුරැස්ස/මුලටියන,දෙනියාය) - පිරිස කැඳවා දීම සඳහා
06. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - පිරිවෙන්( ඇල්පිටිය/ගාල්ල/අම්බලන්ගොඩ,උඩුගම) - පිරිස කැඳවා දීම සඳහා
07. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන් - භාවනා/ සති පිරිවෙන්) - කරු. අ.ක.ස
08. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන් - ත්‍රිපිටක ධර්මය) - කරු. අ.ක.ස
09. ප්‍රධාන අනුශාසක - නිස්සරණ වන සෙනසුන - කරු. අ.ක.ස
10. ගොනුවට

CamScanner